www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ උතුරෙන් හා නැගෙනහිරෙන් හමුදා ඉවත් කරනු

## Troops out of north and eastern Sri Lanka

**2009 ජනවාරි 29**

දිවයිනේ උතුරු ප්‍රදේශයේ මුලතිව් දිස්ත්‍රික්කය තුල කොටුවී සිටින දෙලක්ෂ පනස්දහසකට වැඩි දෙමල මිනිසුන්, ගැහැනුන් හා ළමුන්ට එරෙහිව ශ්‍රී ලංකා හමුදාව විසින් දැන් මුදාහැර ඇති සාපරාධී ප්‍රහාරය හෙලාදකින ලෙස ලෝක සමාජවාදී වෙබ් අඩවිය කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටියි.

දෙමල විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහිව 25 වසරක් තිස්සේ ගෙන යන ලේ වැකි යුද්ධයෙන් පසුව හමුදාව, 25 වන ඉරිදා මුලතිව් නගරය අත්පත් කර ගත් අතර ඉතිරිවී ඇති බෙදුම්වාදී ව්‍යාපාරයේ කොටස්වලට එරෙහිව ප්‍රහාරය පෙරට ගෙන යමින් ප්‍රදේශයේ ජනතාව ත්‍රස්ත කිරීම සඳහා ඉවක් බවක් නැතිව සිය අධිකාරවත් මිලිටරි ශක්තිය යොදා ගනිමින් සිටියි.

මේ තාක් දුරට මිලිටරිය සිය ගනනක් සිවිල් වැසියන් මරා දමමින් ද ඔවුනට තුවාල සිදු කරමින් ද ඊනියා ''යුධ මුක්ත කලාපයට'' හා තාවකාලික රෝහල් වලට ද ගිලන් රථවලට ද වෙඩි තබා හා බෝම්බ දමා තිබේ. සිදුවන මානව ව්‍යසනය දිග හැරෙන්නේ සියලු මාධ්‍යකරුවන්ට යුධ පෙරමුනු තහනම් කිරීම මඟින් යලි බල ගැන්වූ මිලිටරි මාධ්‍ය වාරනයේ තාප්පයට පිටු පසිනි.

28 වන දින නිකුත් කල ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ (අයිසීආර්සී) හදිසි ප්‍රකාශනයකට අනුව දැනටමත් සිය ගනනක් මරනයට පත්වී ඇති අතර 250000 කට වැඩි දෙමල සිවිල් වැසියන් සංඛ්‍යාවක් ප්‍රමානවත් ආහාර හෝ බෙහෙත් නොමැතිව යුධ කලාපය තුල කොටුවී සිටිති. හමුදාව මෙම සතිය තුල බරපතල තුවාලකරුවන් 200 ක් දෙනා ඉවත්කර ගැනීමෙන් අයිසීආර්සී ය වැලැක්වූ අතර, ප්‍රදේශය තුලට අත්‍යවශ්‍ය සහනාධාර ගෙනයාමට ද බාධා කලේය.

උතුරේ සිදුවන මිලිටරි ප්‍රහාරය දින 22 ක් තිස්සේ ගාසා තීරයට එරෙහිව ඊශ්‍රායලය සිදුකල ම්ලේච්ඡ ආක්‍රමනයට පුදුමාකාර සමානකමක් දරයි. ආන්ඩුවේ බොරු හා ප්‍රචාරයන් පවා එක සමාන ය. මිලිටරිය ගෙන යන්නේ ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක්'' මිස රටේ පීඩිත දෙමල සුලුතරයට එරෙහි බිහිසුනු වාර්ගික යුද්ධයක් නොවේ යයි ජනාධිපති රාජපක්ෂ කියා සිටියි.

මොනම යුධ අපරාධයක් හෝ සිදුව ඇතැයි යන්න ප්‍රතික්ෂේප කරන හමුදා ප්‍රකාශකයා අමූලික බොරු ඇදබායි. එල්ටීටීඊයට තවදුරටත් සිවිල් ජනතාව ''මිනිස් පලිහක් '' ලෙස යොදාගත නොහැකිව තිබියදී වුවත් ඔවුන් එසේ කරන බවට බවට චෝදනා කරන මිලිටරිය, අධික ජනගහන ඝනත්වයකින් යුත් එම කුඩා ප්‍රදේශයට බෝම්බ හෙලීම හැර තමන්ට ''වෙනත් විකල්පයක්'' නැතැයි ප්‍රකාශ කරයි. එල්ටීටීඊය සිවිල් ජනතාව බලහත්කාරයෙන් රඳවාගෙන සිටින බව ආන්ඩුව ප්‍රකාශ කරතත්, මිලිටරි පාලනය යටතේ පවතින ප්‍රදේශ කරා පලාගිය ජනතාව ප්‍රමානවත් ආහාර, බෙහෙත් හා ජීවත්වීමේ මූලික අවශ්‍යතාවන්ගෙන් පවා තොරව රැඳවුම් කඳවුරු තුලට ගාල්කර ඇත. සත්‍යය නම් ආන්ඩුව හා මිලිටරිය සමස්ත දෙමල ජනතාවම සතුරෙකු ලෙස සලකන්නේය යන්නයි.

ගාසාවේ ලේ වැකි මිනිස් සංහාරය මෙන්ම ශ්‍රී ලංකාව තුල සිදුවෙමින් තිබෙන සාහසික ක්‍රියාවන් ද ලෝකය පුරා කම්කරු පන්තියට කෙරෙන අනතුරු ඇඟවීමකි. ඊශ්‍රායල් ආන්ඩුවට පිටුබලය දුන් එක්සත් ජනපදය ප්‍රමුඛ මහා බලවතුන් දැන් රාජපක්ෂ තන්ත්‍රය පිටුපසින් පෙලගැසී සිටිති. සිවිල් වැසියන්ගේ දුක්ගැනවිලි පිලිබඳව කනස්සල්ල පලකරන සියලු කුහක ප්‍රකාශ මධ්‍යයේ වොෂින්ටනය, 2002 සටන්විරාමය උල්ලංඝනය කල විට ද, 2006 ජූලි මස යුධ මෙහෙයුම් යලි දියත් කල විට ද රාජපක්ෂට සහාය පලකල අතර, ශ්‍රී ලංකා මිලිටරියට ත්‍රස්තවාදයට එරෙහි සටන් පුහුනුව ද රහස් තොරතුරු හා උපකරන ද සැපයීය.

මිලිටරි ප්‍රහාරයන් මුලුමනින්ම අනුමත කරන අතර තුර දෙමල ජනතාවගේ ''ආරක්ෂාව'' පිලිබඳව කිඹුල් කඳුලු හෙලන ඉන්දීය ආන්ඩුව ද ඒ හා සමානවම සාපරාධීය. 27 වන දින ශ්‍රී ලංකාවට සැපත්වූ ඉන්දීය විදේශ ඇමති ප්‍රනාබ් මුඛර්ජි නරුම ලෙස ප්‍රකාශ කලේ මිලිටරි ජයග්‍රහන දෙමල බහුතරයක් සහිත උතුරු ප්‍රදේශවලට ''සාමය ලඟාකර දෙනු'' ඇති බවයි. උතුර සඳහා රාජපක්ෂ ආන්ඩුවේ ගබඩාවෙහි ඇත්තේ කුමක් ද යන්න ''විමුක්ත කරගත්'' නැගෙනහිර තුල -හමුදා අනසකට යටත්කිරීම කුප්‍රකට අර්ධ සන්නද්ධ කල්ලියක නායකයෙකුගේ ප්‍රධානත්වයෙන් සිදුවන - දැනටමත් දැක ගත හැකිව තිබේ.

ඒල්ටීටීඊය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස හංවඩු ගැසීම සැලසුම් කරනු ලැබුවේ, 1948 නිදහස ලැබූ තැන් පටන් බලයට පත් ආන්ඩු විසින් දෙමල සුලුතරයට එරෙහිව ක්‍රමානුකූලව ගෙනගිය වෙනස්කම් කිරීම තුල රැඳී ඇති, දිවයිනේ 25 වසරක සිවිල් යුද්ධයේ සැබෑ මූලයන් වසංකිරීමටය. රටේ ආර්ථික පසුගාමිත්වයටත්, දුප්පත් කමටත් කිසිදු ප්‍රගතිශීලී විසඳුමක් සම්පාදනය කිරීමේ ලා ඓන්ද්‍රියවම අසමත් කොලඹ දේශපාලඥයෝ, කම්කරු පන්තිය හා පීඩිත ජනතාව බෙදා පාලනය කිරීම සඳහා දෙමල විරෝධී ස්වෝත්තමවාදය ඇවිස්සීමේ හිටපු බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයන්ගේ පොතෙන් පිටුවක් ඩැහැගත්හ.

රජපක්ෂ රටට ප්‍රජාතන්ත්‍රවාදය ගෙන එන බව කියා සිටියත්, ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ප්‍රාථමික අවශ්‍යතාවක් වන්නේ සියල්ලන්ගේම මූලික අයිතීන් සහතික කිරීමයි. දෙමල ජනතාව රැකියා, අධ්‍යාපනය මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය සේවයට පිවිසීම ද ඇතුලු ඔවුන්ගේ ජීවිතයේ සෑම අංශයකදීම වෙනස්කම් කිරීමකට මුහුන දුන්හ. බෞද්ධාගම රාජය ආගම බවට පත් කල ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවෙන් වර්ගවාදය නීති ගත කර තිබේ. එල්ටීටීඊයට එරෙහි යුද්ධයේ අරමුන වන්නේ දිවයිනේ සිංහල ප්‍රභූ පැලැන්තියේ ආධිපත්‍යයෙහි අඛන්ඩතාවය සුරක්ෂිත කර ගැනීමයි.

කෙසේවුව ද එල්ටීටීඊය දෙමල ජනතාව සඳහා කිසිදු ශක්‍ය ඉදිරිදර්ශනයක් විස්තාරනය කිරීමට සමත් වූයේ නැත. පසුගිය වසර තිස්සේ ඔවුන් මුහුනපෑ මිලිටරි බිඳවැටීම වනාහි, ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර, එක් හෝ තවත් මහා බලවතෙකු විසින් අනුග්‍රහය දක්වන වෙනම දෙමල ධනේශ්වර රාජ්‍ය කැබැල්ලක් අටවා ගැනීමේ ඉදිරිදර්ශනයෙහි බංකොලොත් කම ප්‍රකාශිත වීමකි. ශ්‍රී ලංකා ආන්ඩුවේ සාපරාධී යුද්ධයට ඊනියා ''ජාත්‍යන්තර ප්‍රජාව''සිය අනුකූලත්වය පලකරද්දී පවා, එල්ටීටීඊය එක දිගට එම අධිරාජ්‍යවාදී බලවතුන්ගෙන්ම නිවට ලෙස සහාය ඉල්ලා සිටියහ.

එල්ටීටීඊයේම වාර්ගික ඉදිරිදර්ශනය, යුද්ධය හා මර්ධනය සම්බන්ධයෙන් ඔවුන් නිතරම චෝදනා කල සිංහල කම්කරු පන්තිය හා ගොවි ජනතාව වෙත, කිසිදු ආයාචනයක් කිරීමට නොහැකි තැනකට ඔවුන් ඇද දැමීය. සිංහල සිවිල් ජනතාව මත ඔවුන් එල්ල කල ප්‍රචන්ඩ ප්‍රහාර කෙලින්ම සිංහල අන්තවාදීන්ගේ හා මිලිටරිවාදීන්ගේ අත් ශක්තිමත් කලේය.

අන් සියල්ලටත් වඩා එල්ටීටීඊයේ බිඳී විසිරී යෑම හා දෙමල ජනතාවට මොනම ඉදිරි මාවතක් හෝ සැපයීමට එයට පැවති නොහැකියාව පැහැදිලිවම පෙන්නුම් කරන්නේ දෙමල කම්කරුවන්ට හා ගොවීන්ට නව දේශපාලන මූලෝපායක් අවශ්‍යවන බවයි. දෙමල ජනතාවගේ සැබෑ මිතුරා ජාත්‍යන්තර කම්කරු පන්තියයි. ශ්‍රී ලංකාව තුල ලේ වැකි ව්‍යසනයට අවසන් තිත තැබිය හැකි හා ජාතිවාදයේ හා යුද්ධයේ මූලය වන ධනවාදයට එරෙහිව අව්‍යාජ අරගලයක් වර්ධනය කල හැකි එකම බලවේගය වන්නේ එයයි.

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා එහි සියලු ශාඛාවන් ද, පෙබරවාරි 14 වන දින පැවැත්විමට නියමිත මධ්‍යම හා වයඹ පලාත්සභා මැතිවරනයේ දී නුවරඑලිය හා පුත්තලම දිස්ත්‍රික්ක සඳහා තරග වදින ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය ද (සසප) පෙනී සිටි හා සටන් වදින ක්‍රියාමාර්ගය එයයි. සසප අපේක්ෂකයෝ කම්කරුවන්ට, තරුනයන්ට හා ශිෂ්‍යයන්ට යුද්ධයේ පන්ති ස්වභාවය පැහැදිලි කරමින් දිවයිනේ උතුරෙන් හා නැගෙනහිරෙන් වහාම හා කොන්දේසි විරහිතව ශ්‍රී ලංකා හමුදාවන් ඉවත් කරන ලෙස ද, දෙමල ජනතාවට හදිසි ආධර සපයන ලෙස ද කියා සිටියි.

දෙමල ජනතාවට එරෙහි 25 වසරක යුද්ධය, සියලුම සිංහල, දෙමල හා මුස්ලිම් කම්කරුවන්ට අත්කරදී තිබෙන්නේ, දහස් ගනන් රැකියා, සටන් වැද දිනාගත් අයිතීන් වැනසී ගිය හා වැඩකරන ජනතාවගේ ද ගොවීන්ගේ ද මූලික අයිතිවාසිකම් වලට එල්ල කෙරෙන ප්‍රහාරයන්ගේ වියදමෙන් 70000 කට අධික ජීවිත විනාශය හා ලක්ෂ ගනනක් සරනාගතයන් බිහිකිරීමේ කාලකන්නි තත්වයයි.

වැඩකරන ජනතාවගේ සෑම කොටසකටම කියනු ලබන්නේ ඔවුන් සිය ජීවන තත්වයන් කැප කල යුතු බවයි. ආන්ඩුවේ මෙම නියෝග ප්‍රතික්ෂේප කරන අය එල්ටීටීඊයේ සගයන් හා ත්‍රස්තවාදී ආධාරකරුවන් ලෙස හංවඩු ගසනු ලැබේ. මිලිටරියේ අනුග්‍රහය ලබන ඝාතක කල්ලි විසින් සිය ගනන් ජනතාව ''අතුරුදහන්කර'' හෝ මරා දමා ඇත. එල්ටීටීඊයට එරෙහිව අත්කර ගන්නා මිලිටරි ජයග්‍රහනයකින් මෙම ක්‍රමවේදයන් අවසන් නොවනු ඇත. ගැඹුරු වන ගෝලීය ආර්ථික අර්බුදයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට තව දුරටත් පහර වදින තතු හමුවේ එම තත්වය ඉදිරියේදී තවත් උත්සන්න වනු ඇත.

ශ්‍රී ලංකා ආන්ඩුවේ ජයඝෝෂාවන්ට හා එහි සාපරාධී යුද්ධයට එරෙහිව සසප අවධාරනය කරන්නේ, එකම විසඳුම සමාජවාදී ක්‍රියාමාර්ගයක් යටතේ කම්කරුවන්ගේ හා ගොවීන්ගේ අන්ඩුවක් පිහිටුවීම හා සියලුම රූපාකාරයන්ගේ වර්ගවාදයට එරෙහිව පාලක පැලැන්තීන්ගේ ලාභ අවශ්‍යතාවන් සඳහා නොව මනුෂ්‍ය වර්ගයාගේ අවශ්‍යතාවන්හි පදනම මත සමාජය ප්‍රතිසංවිධානය කිරීම පමනක් බවයි.

**රිචඩ් ෆිලිප්ස්**

© www.wsws.org